**පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

# පුරප්පාඩු

# පොල් පර්යේෂණ ආයතනය

පොල් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුර(වගා සංරක්ෂණ අංශය, ශෂ්‍ය විද්‍යා අංශය, පටක රෝපණ අංශය) සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුර (යාන්ත්‍රික ඉංජිනේරු) (පොල් සැකසුම් පර්යේෂණ අංශය)

**සුදුසුකම් :**

**බාහිර** : පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු (04) විශේෂ පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත විද්‍යා, කෘෂිකර්මය හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා උපාධිය

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු (04)විශේෂ දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිත විද්‍යා, කෘෂිකර්මය හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා උපාධිය සමග අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ එක් අවුරුදු පශ්චාත් උපාධිය

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් විද්‍යා, කෘෂිකර්මය හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ දෑ අවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධිය

සහ

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (PhD) සමග ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 08 ක පර්යේෂණ පළපුරුද්ද.

**අභ්‍යන්තර** : ආචාර්ය උපාධිය (PhD) සමග අවම වශයෙන් AR 1 ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරියෙකු වශයෙන් වසර 08 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

හෝ

දෑ අවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධිය (M Phil/M.Sc.) සමග AR 1 ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරියෙකු වශයෙන් වසර 10 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

**සටහන** : අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ නිබන්ධන නිකුත් කර තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩුවිය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **වැටුප් කාණ්ඩය** : AR 2
- **වැටුප් පරිමාණය** : 76,200/-10X2,000/-96,200/-
- **ආරම්භක වැටුප් තලය** : රු.76,200.00 - (2/2016 (I) චක්‍රලේඛය ප්‍රකාරව)

**අනෙකුත් ප්‍රතිලාභ :**

1. මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

i. ජීවන වියදම් දීමනාව - රු.7800/-

ii. වෘත්තීය දීමනාව

iii. සන්නිවේදන දීමනාව

iv. තේ දීමනාව

## 02. වතු අධිකාරී තනතුර - ශ්‍රේණිය II

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර** : පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය පිළිබඳ වූ උපාධිය සමග හෙක්ටයාර 50 කට නොඅඩු වතු පාලනය පිළිබඳ අවුරුද්දක (01) පශ්චාත් පළපුරුද්දක් තිබීම.

**සටහන** : පොල් වතු කළමනාකරණය හා කම්කරු පාලනය පිළිබඳ පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහිවිශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**අභ්‍යන්තර** : පිළිගත් උපාධියක් සමග සහකාර වතු අධිකාරිවරයෙකු ලෙස අවුරුදු 05 සතුටුදායක සේවයක් සපුරා තිබීම

හෝ

කළමනාකරණ සහකාර - තාක්ෂණික කාණ්ඩයේ පළමුවන ශ්‍රේණියේ ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස වසර 05 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

- **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **වැටුප් කාණ්ඩය** : JM 1-2
- **වැටුප් පරිමාණය** : රු.43,355/-10X755/-18X1,135/- 71,335/-
- **ආරම්භක වැටුප් තලය :** රු.43,355.00 (2/2016 චක්‍රලේඛය ප්‍රකාරව)

**අනෙකුත් ප්‍රතිලාභ:**

1. මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   i. ජීවන වියදම් දීමනාව - රු.7800/-
   ii. ගාස්තු රහිතව අංගසම්පූර්ණ නිල නිවාස පහසුකම් (කම්කරුවකු සහිත)
   iii. දුරකථන දීමනාව
   iv. තේ දීමනාව

**පොදු කොන්දේසි**

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් පසුවිය යුතුයි.
3. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

**පොදු ප්‍රතිලාභ**

1. 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2016.04.25 දිනැති අංක 2/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
2. දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
3. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහාද දායක වනු ඇත)
4. පොල් පර්යේෂණ ආයතනයේ සේවකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභද හිමිවනු ඇත.

**අයදුම්කරුවන් විසින් උප්පැන්න සහ අනෙකුත් අදාළ සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත් වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරීගෙන් විය යුතුය.), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග අයදුම්කරු විසින් අත්සන් කරන ලද** තම අයදුම්පත **2021.09.07** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල, 61150** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ප්‍රමාද වී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකිය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාළ සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

**මේ පිළිබඳව බලපෑම් කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.**

මෙම දැන්වීම පොල් පර්යේෂණ ආයතනයේ වෙබ් පිටුව වන www.cri.gov.lk මඟින්ද බලා ගත හැක.

**සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල.**

Source: Dinamina, Daily News (2021.08.09)